අද 2016 11.17

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO
18
පිටු 13

# රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණනය අද පැවැත්වේ

**ෂමිල පෙරේරා**

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණනය අද (17දා) දින පෙ.ව. 9:30 සිට පෙ.ව.11:30 දක්වා කාලය තුළ රට පුරා පැවැත්වෙයි.

ඒ අනුව, තොරතුරු රැස් කිරීමේ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීම සඳහා මෙම සංගණනය සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ සහභාගීත්වයෙන් අද සිදුකෙරෙන බව එම දෙපාර්තමේන්තුව පවසයි.

ශ්‍රී ලංකාවේ මුල්වරට රාජ්‍ය අංශයේ සංගණනයක් පවත්වා ඇත්තේ වර්ෂ 1968 දී වන අතර ඉන් අනතුරුව 1972, 1976 වර්ෂවලදී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයන් පවත්වා ඇත. එහිදී සංගණනය සඳහා ගණන් ගැනීම සිදුකර ඇත්තේ ස්ථිර රාජ්‍ය සේවකයන් පමණක් වන අතර, එම සංගණනය පවත්වා ඇත්තේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහාය ඇතිව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසිනි. ප්‍රථම වරට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සේවක සංගණනයක් පවත්වා ඇත්තේ 1980 දී වන අතර, එහිදී සියලුම ස්ථිර, තාවකාලික, අනියම්, කොන්ත්‍රාත් පදනම මත, ද්විතීයික පදනම මත, දෛනික වැටුප් ලබන ආදී සියලු කාර්ය මණ්ඩල ගණන් ගෙන තිබේ. එතැන් සිට 1980, 1985, 1990, 1994, 1998, 2002 සහ 2006 වසර වලදීද මෙම සංගණනය පවත්වා ඇත. සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැවැත්වෙන මෙම සංගණනය මෙවර පැවැත්වෙන්නේ 11 වැනි වරටය.

මෙම සංගණනයේ අරමුණ වී ඇත්තේ සංගණන දින වනවිට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලය ගණන් ගැනීම සහ එම කාර්යය මණ්ඩලය පිළිබඳව ප්‍රජා විද්‍යාත්මක, සමාජයීය සහ ආර්ථික තොරතුරු රැස්කිරීම බවත්, මෙම තොරතුරු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීමට උපකාරී වන බවත් එම දෙපාර්තමේන්තුව පවසයි.

මෙවර සංගණනය යටතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සියලුම සේවා නියුක්තිකයන් ප්‍රමාණය සහ ඔවුන්ගේ වයස්, ස්ත්‍රී පුරුෂභාවයන්, වර්තමාන සේවා ස්ථානය, තනතුර, පත්වීමට අදාළ තොරතුරු, වැටුපට අදාළ තොරතුරු, නිවාඩු පිළිබඳ විස්තර, භාෂා ප්‍රවීණතාව, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පදිංචිය පිළිබඳ විස්තර, ගමනාගමනයට අදාළ විස්තර, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම, බෝ නොවන රෝග පිළිබද තොරතුරු ආදී තොරතුරු රැසක් රැස් කෙරෙන බවද පෙන්වා දෙයි.

මෙවර සංගණනය පවත්වන ක්‍රමවේදයේ වෙනස්කම් කිහිපයක් සිදුකර ඇත. පළමු වරට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන පිළිබඳ විධිමත් ලැයිස්තුවක් සකස් කිරීම ඉන් එකක් වන අතර, ඒ යටතේ ආයතන 28,000ක් පමණ ලැයිස්තුගත කර ඇත. තවද, ආයතනයට අයත් සේවකයන් පදනම් කරගෙන තොරතුරු රැස් කිරීම වෙනුවට රාජ්‍ය සේවකයන් සේවය කරන ස්ථානය පදනම් කරගෙන තොරතුරු රැස් කිරීමත් (Institutional Base vs Location Base), රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ වතු කම්කරුවන් සංගණනයට ඇතුළත් කිරීමත්, මුළු රටම ආවරණය වන පරිදි සියලුම රාජ්‍ය හා අර්ධරාජ්‍ය සේවකයන් එක් දිනක් හා එකම වෙලාවක් තුළ ගණන් ගැනීමත්, ආයතනික වත්කම් පිළිබඳ සීමිත තොරතුරු ප්‍රමාණයක් රැස් කිරීමත් ආදිය මෙවර සංගණනයේ තවත් විශේෂත්වයන් කිහිපයක් බවද පවසයි.

එමෙන්ම, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණනයේ සියලු තොරතුරු ඇතුළත් වෙබ් පිටුවක් එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.statistics.gov.lk හි ඇතුළත් කොට ඇත. එහි සංගණනය සඳහා භාවිත කරන සියලු ලේඛනවල (ප්‍රශ්ණාවලි, උපදෙස්, කේත ලැයිස්තු ආදී) පිටපත් සහ සංගණන ප්‍රශ්නාවලියේ සියලුම ප්‍රශ්න පිරවීම සඳහා උපදෙස්, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යවලින්, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ඇතුළත් කොට ඇති බවද දෙපාර්තමේන්තුව පවසා සිටියි.

ඒ අනුව, අද (17දා) දින පෙ.ව. 9:30 - පෙ.ව.11:30 ත් දක්වා කාලය අතරතුරදී සංගණන ප්‍රශ්ණාවලිය (Emp-1) නිවැරදිව සම්පූර්ණ කොට මෙම සංගණනය සාර්ථක කර ගැනීමට සහාය වන ලෙස ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන්ගෙන් ඉල්ලා සිටී.